# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/01/චක්‍රලේ.

ඔබේ අංකය / உமது இல / Your No: ........................................

දිනය / திகதි / Date: 2026.02.02

***සමෘද්ධි චක්‍රලේඛ අංක : සමාජ සංවර්ධන හා පරිසර - 2026/06***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

## සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2026

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2026 වසරට පවුල් ලක්ෂ 02ක් සවිබල ගැන්වීමේ වැඩසටහන මේ වනවිට ආරම්භ කර ඇත. එහිදී තිරසර හා උසස් ජීවන මට්ටමක් අත්කරදීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුලදී ආර්ථික, සාමාජීය හා මානසික වශයෙන් සවිබල ගැන්වීම මෙහි පරමාර්ථය වේ.

02. සමාජ සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක සියළු වැඩසටහන් "මනෝසාමාජීය සවිබල ගැන්වීම" යටතට අයත් වේ. එබැවින් සවිබල ගැන්වීමට අදාලව තෝරාගෙන ඇති පවුල් ඉලක්ක කර ගනිමින් 2026 වසර තුල පහත පෙලගස්වා ඇති අයුරින් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

03. "මනෝසාමාජීය සවිබල ගැන්වීමේ වැඩසටහන" වඩාත් ඵලදායී කර ගැනීම සඳහා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඇති සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් සඳහා විශේෂිත වූ පුහුණුවක් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය හරහා ලබාදී ඇති අතර එම නිලධාරීන් ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සමාජ සංවර්ධන නිලධාරීන් මේ සඳහා පූර්ණ වශයෙන් දායකත්වය ලබාදිය යුතුය.

04. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජන ජීවිතය සංවර්ධනය කිරීම සඳහා බොහෝ ආර්ථික වැඩසටහන් ක්‍රියාවට නංවා ඇතත්, දිනෙන් දින වර්ධනය වන සමාජීය ගැටලු නිසා අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟාවීමට නොහැකි වී ඇත. ප්‍රජාවගේ මානසික හා සමාජීය ගැටලු වලට ආමන්ත්‍රණය කිරීම සඳහා බොහෝ ආයතනගත නිළධාරින් ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් රාජකාරිවල නිරතව ඇතත්,


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ඔවුන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු නොකිරීම නිසා පොදුවේ ග්‍රාමීය ප්‍රජාව මුහුණ දෙන ගැටළුවලට තිරසාර විසඳුම් ලබා ගැනීමට නොහැකි වී ඇත.

05. ඒ අනුව අවාසිසහගත තත්වයට පත් ජනතාව ආර්ථික, සාමාජීය, සංස්කෘතික, මානසික සෞඛ්‍ය හා පාරිසරික හා අධ්‍යාපන වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා ඵලදායි වැඩසටහන් ප්‍රජා සහභාගිත්වය ලබා ගනිමින් 2026 වසරට ක්‍රියාත්මක කිරීමට සමාජ සංවර්ධන හා පරිසර අංශය වැඩසටහන් පෙළගස්වා ඇත. එබැවින් ප්‍රාදේශීය මට්ටමින් සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරින් සහභාගි කරගෙන 2025 වසර තුල ක්‍රියාත්මක කළ ආකාරයටම පහත සඳහන් සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. මෙහිදී නිර්මාණාත්මක හා උපායශීලි ක්‍රම අනුගමනය කළ හැකිය.

1. **භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වැඩසටහන්**
2. **සමාජ සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක වැඩසටහන්**

**1. භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක වැඩසටහන්**

**2026 වසරේ සවිබලගැන්වීමට අදාලව තෝරාගන්නා අස්වැසුම ප්‍රතිලාභ ලබන දූප්පත්, අන්ත දූප්පත් හා අවධානමට ලක්වූ සමාජ කාණ්ඩයට අයත් පවුල් අතරින් විශේෂයෙන් සැලසුම් අංශය මගින් ලබාදී ඇති උපදෙස් පරිදි, සවිබල ගැන්වීමට හඳුනාගනු ලබන අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා පහත වැඩසටහන් පැවැත්විය යුතුය.**

- **පුහුණුව හා දැනුවත්කිරීම - තම ශක්තීන් අවබෝධ කරගැනීමපිළිබඳ දැනුවත්කිරීම**
- **උපදේශන වැඩසටහන් - පවුල් උපදේශන**
- **මත්ද්‍රව්‍ය නිවාරණය - මතින් තොර සමාජයක් බිහි කිරීම**
- **ආකල්ප සංවර්ධන - අභියෝග ජයගැනීම හා ධනාත්මක චින්තනය**

**යන වැඩසටහන් ඔස්සේ මනෝ සමාජීය පුහුණුවීම මගින් සමාජීය සවිබල ගැන්වීමේ කාර්යය අපවෙත පැවැරි ඇත. ඒ සඳහා ප්‍රතිපාදන ඉදිරියේදී ඔබ වෙත ලබාදීමට අපේක්ෂා කරමි. මේ සඳහා අපගේ විශේෂ පුහුණුවලත් කණ්ඩායම හා රේඛීය ආයතනවල විශේෂයෙන් ඒ පිළිබඳ දැනුම ඇති උපදේශන නිලධාරීන් හා විශේෂිත වූ නිලධාරීන් ද මේ සඳහා යොමුකිරීමට පියවර ගත යුතුය.**

**මීට අමතරව පසුගිය වසර තුල අප විසින් සවිබලගැන්වීම් යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් හා මෙම වසරට අදාල ප්‍රතිලාභීන් පමණක් නොව ඉහත පුහුණුව ලබාදී ඇති ප්‍රතිලාභීන්ගේ තවදුරටත් ඉහල මට්ටමේ පුහුණුවක් හෝ මැදිහත්වීමක් අවශ්‍යවන අවස්ථාවල ඒ ඒ ආයතනවල නිලධාරීන් සමග මැදිහත්ව ඔවුන්ගේ සහාය ඔස්සේ අදාල පුහුණුව හෝ සහායන් සඳහා යොමුකිරීමට කටයුතු කල යුතුව ඇත.**

**තවදුරටත් ඔබ කොට්ඨාසයේ හෝ යාබද කොට්ඨාසවල එවැනි කීපදෙනෙකු එනම් කණ්ඩායමක් ලෙස හඳුනාගෙන සිටී නම් ඔවුන් සඳහා වැඩිදුර පුහුණුවක් හෝ දැනුවත් කිරීමක් අවශ්‍ය වන බවට හඳුනා**

**ගතහොත් ඒ සඳහා යම් පිරිවැයක් දැරීමට අවශ්‍ය වන්නේ නම් එය අප අංශය විමසා අනුමැතිය ලබාගැනීමට ඉඩප්‍රස්ථාව පවතී.**

**උදා _ පවුල් සංවර්ධන සැලැස්ම මගින් හඳුනාගන්නා සමාජමය වශයෙන් යහපත් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් අවශ්‍යතාවයක් හෝ ජාතික හැඳුනුම්පත් නොමැති පවුල් ආදී කණ්ඩායම් වෙනුවෙන් එක්දින ජංගම සේවාවන් හෝ මානසික සෞඛ්‍ය සම්බන්ධ විද්වත් දේශන හෝ පොලිස් ස්ථානවල නිලධාරීන්, සෞඛ්‍ය සේවා නිලධාරීන් සම්බන්ධ කොට වැඩසටහන් පැවැත්විය හැකිය.**

**විශේෂයෙන් පසුගිය 2025 වසරතුල හඳුනාගත් ඉහත පුහුණුව ලත් ප්‍රතිලාභීන්ගේ ඉලක්ක ප්‍රථිඵල (Out Come) ලබාදීම සඳහා නිරන්තර පසුවිපරම් කර මාසික ප්‍රගති වාර්තා සඳහා ඇතුලත් කල යුතුය. ඊට අදාල තොරතුරු හා වාර්තා තබාගැනීම සිදුකල යුතු අතර කේෂ්ත්‍ර පරීක්ෂාවන්හිදී එය නිරීක්ෂණයට ඉදිරිපත් කල යුතුය.**

**මෙම සියළු තොරතුරු තොරතුරු කලමණාකරණ පද්ධතියට ඇතුලත් කිරීමට (EIS) අවශ්‍ය පියවර තොරතුරු තාක්ෂණ අංශය මගින් ගෙන ඇත.**

**2. සමාජ සංවර්ධන අරමුදල මගින් ක්‍රියාත්මක වැඩසටහන්**

**සමාජ සංවර්ධන අරමුදල මගින් මෙම වර්ෂයේදී පෙර ලෙසින්ම පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.**

**1. මත්ද්‍රව්‍ය හා දුම්කොළ නිවාරණය, ගෘහ කළමනාකරණ හා සතුටු පවුල් වැඩසටහන.**

වර්තමානය වනවිට, දුම්වැටි මත්වතුර හා නොයෙකුත් අහිතකර මත්ද්‍රව්‍යවලට ප්‍රජාව, තරුණ තරුණියන් හා දරුවන් ඇබ්බැහිවීම විශාල වශයෙන් වැඩි වී ඇත. එබැවින් මෙම ඇබ්බැහිවීම් වැලැක්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. 2024 වර්ෂයේ මේ සම්බන්ධයෙන් කරන ලද සමීක්ෂණයට අනුව මත් හා දුම්වැටිවලට ඇබ්බැහි වී ඇති පුද්ගලයින් ඉන් මුදා ගැනීම සඳහා සුදුසු දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට යොමු කිරීමද කළ යුතුවේ. විශේෂයෙන් සවිබල ගැන්වීමට තෝරාගත් පවුල්වල අඩු ආදායම්ලාභීන් මත්ද්‍රව්‍ය හා දුම්වැටියෙන් මුදා ගැනීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. මේ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආයතනවල සහයෝගය හා කොට්ඨාසය තුලින් තෝරා ගන්නා පොලිස් ස්ථානවල නිලධාරීන්ගේ සහයෝගය ලබාගැනීමටද කටයුතු කළ යුතුවේ.

විශේෂයෙන් දුම්වැටි හා මත්ද්‍රව්‍ය වලින් ප්‍රජාව මුදා ගැනීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ දී ප්‍රධාන වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන හා මීට අමතරව රාජ්‍ය නොවන ආයතනවල න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ඇති සම්පත්

දායකයින් යොදාගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා වූ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අදාල සැලසුම් සකස් කරගත යුතුවේ. උදාහරණ ලෙස බස්රථ රියදුරන්, ත්‍රිවිල් රථ රියදුරන්, පාසල් වෑන්රථ රියදුරන්, එදිනදා මෙම උවදුරින් පීඩාවට පත් පවුල් වල ප්‍රතිලාභීන්, 11,12,13 වසර වල පාසල් දරුවන්, අඩුආදායම්ලාභීන් ගත හැක.

**2. සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය වැඩසටහන**

දැයේ දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මෙන්ම අනාගත වැඩ ලෝකයට ගැලපෙන අයුරින් දරුවන් නිර්මාණය කිරීම සඳහා අවු 05 – 18 අතර වයසේ පසුවන දරුවන් ග්‍රාමීය මට්ටමින් සමෘද්ධි කැකුළු ළමා සමාජ වටා ඒකරාශී කරමින් ඔවුන් සමග විවිධ ක්‍රියාකාරකම්වල යෙදෙමින් දැනුම, ආකල්ප, කුසලතාවලින් පිරිපුන් ගුණ නුවණින් යුතු අභියෝග ජය ගත හැකි දරුවන් දැයට දයාද කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

සවිබල ගැන්වීමට තෝරාගත් පවුල්වල සාමාජීය සවිබල ගැන්වීම උදෙසා එම පවුල්වල සතුට ප්‍රවර්ධනය කිරීම උදෙසා එක් එක් වයස් කාණ්ඩවල දරු දැරියන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. දැනට මෙම වැඩසටහන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් පැවැත්විය යුතුය.

එහිදී පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු වේ.

1. වයස අවුරුදු 7-10, 11-14, 15-18 වයස් කාණ්ඩවල දරුවන් සඳහා සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය පැවැත්වීම
2. 5 වසර ශිෂ්‍යත්ව දරුවන් සඳහා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන්, සාමාන්‍යපෙළ දරුවන් සඳහා විභාග පෙරහුරු වැඩසටහන් හා මානසික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
3. පාසල් යන වයසේ සිටින එහෙත් පාසල් නොයන දරුවන් පාසල් අධ්‍යාපනයට යොමු කිරීම
4. මාපිය කැපකරු වැඩසටහන් සකස් කිරීම
5. පාසල් දරුවන් සඳහා අවශ්‍ය කරන පාසල් උපකරණ හා අභ්‍යාස පොත් ලබාදීම
6. 11,12,13 වසරවල පාසල් දරුවන් සඳහා මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. පාසල් දරුවන් සඳහා ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
8. පාසල් දරුවන් සඳහා රස වින්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
9. අවශ්‍ය අවස්ථාවල උපදේශන සේවාවන් ලබාදීම
10. දරුවන් වෙනුවෙන් පුස්තකාල සේවා ආරම්භ කිරීම
11. ක්‍රියාත්මක කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති කොට්ඨාසවල ස්වේච්ඡා ගුරුවරුන් සොයා ගනිමින් නැටුම්, සංගීත, චිත්‍ර, නාට්‍ය කරණය, දෙමල භාෂාව, ඉංග්‍රිසි භාෂාව, කරාතේ, වෙස් වැනි කුඩා කණ්ඩායම් පන්ති පැවැත්වීම
12. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නව නිර්මාණාත්මක වැඩසටහන් ඇති කිරීම

**3. ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

2026 වසරට අදාලව පහත පරිදි ජාත්‍යන්තර දිනයන්ට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරගත යුතුවේ.

1. ***ජාත්‍යන්තර කාන්තා දින (මාර්තු 8)***
   - ගර්භනී මාතාවන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්
   - කාන්තාවන් සමබන්ධ නීතිය සම්බන්ධයෙන් වන දැනුවත් කිරීමේ වැඩසටහන්
   - අන්තර්ජාල හා ජංගම දුරකථනවල භයානක බව සම්බන්ධ දැනුවත් කිරීම
   - විවේකය ඵලදායි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම
   - කාන්තා අපරාධ සම්බන්ධයෙන් වන දැනුවත් කිරීමේ වැඩසටහන්
   - කාන්තාවන් සඳහා ස්වයං රැකියාවන් ඇති කිරීම සම්බන්ධ දැනුම් ලබාදීම

2. ***ජාත්‍යන්තර දුම්වැටි හා මත්විරෝධී දිනය (මැයි 31)***
   - මේ සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

3. ***රුක් රෝපණ වැඩසටහන***

   2026 ජුලි 05ට යෙදෙන ජාතික රුක්රෝපණ දිනයට සමාගමීව දිවයින පුරා සියළු ප්‍රජාමූල සංවිධාන හරහා රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

4. ***ජාත්‍යන්තර සාක්ෂරතා දිනය (සැප් 08)***

5. ***ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනය (ඔක්. 01)***

6. ***ජාත්‍යන්තර දිළිඳුකම පිටු දැකීමේ දිනය (ඔක්. 17)***

මෙම සියළු වැඩසටහන් සමාජ සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වන අතර ඒ ඒ දිනයන්ට අදාලව වෙන වෙනම උපදෙස් පත්‍රිකා හා චක්‍රලේඛ නිකුත් කිරීමට නියමිතව ඇත.

**4. නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන**

සමාජ සංවර්ධන විෂයට අදාලව කටයුතු කරන සියළුම කාර්යමණ්ඩලවල කුසලතා වර්ධනය කිරීම උදෙසා වන පුහුණු වැඩසටහන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. දැනට බැංකු සමිතිවලට අනුයුක්ත කර සිටින සමාජ සංවර්ධන සහකාර වරුන්ගේ වැඩි පිරිසක් වැඩසටහනට අදාල මූලික පුහුණුවීම් ලබාගෙන නොමැති

බැවින් ඔවුන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කෙරේ. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළහැකි වැඩසටහන් පැවැත්වීම උචිතය.

**5. පහ වසර දරුවන් සඳහා ශිෂ්‍යත්ව හා සාමාන්‍යපෙළ විභාග ඉලක්ක කර පෙරහුරු වැඩසටහන් සහ මානසික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

පසුගිය වසරේ මෙන්ම මෙම වර්ෂයේ ද ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින අඩු ආදායම්ලාභී පවුල්වල දරු දැරියන් සඳහා මෙන්ම අඩු පහසුකම් සහිත ප්‍රදේශවල දරුවන් සඳහාද ප්‍රවීණ ගුරුභවතුන්ගේ සහය ලබාගෙන ඉහත විභාග සඳහා පෙරහුරු වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඊට සමගාමීව දරුවන්ගේ මානසික සංවර්ධනය, මානසික සංතෘප්තිය ඇති කිරීම සඳහා වන ආධ්‍යාත්මික හා රසවින්දනාත්මක වැඩසටහන් ද පැවැත්වීමට කටයුතු කළ යුතු වේ.

**6. කාලීන අවශ්‍යතා අනුව සමාජ සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කළයුතු වෙනත් විශේෂ වැඩසටහන් හා ඔබ කොට්ඨාසයට ආවේනික විශේෂ වැඩසටහන්**

**7. ආදරණීය තාත්තා වැඩසටහන**

**දැනට ආරම්භ කර ඇති දිස්ත්‍රික්කවල ඉතිරි කොට්ඨාස සඳහා ව්‍යාප්ත කිරීම හා හඳුනාගන්නා නව දිස්ත්‍රික්කවල වැඩසටහන ආරම්භ කිරීම**

**8. රාජ්‍ය නොවන සංවිධාන සමඟ කරනු ලබන කාලීන අවශ්‍යතා අනුව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්**

**මෙම වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගනිමින්, එම ආයතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම කළයුතු අතර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය දැනුවත් කර අනුමැතිය ලබාගත යුතුය.**

**9. ප්‍රගති සමාලෝචන වැඩමුළුව පැවැත්වීම.**

***a. දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය***

සමස්ථ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සොයා බැලීම සඳහා විෂයට අදාල නිලධාරින් දිස්ත්‍රික්කයට කැඳවා කාර්තු දෙකකට වරක් එක් ප්‍රගති සමාලෝචනයක් බැගින් සිදු කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් නිලධාරීන් කැඳවීම සුදුසු වේ.

i. දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂයභාර කළමනාකරු/ සමාජ සංවර්ධන විෂය පැවරි ඇති සමෘද්ධි සංවර්ධන නිලධාරි
ii. විශේෂ නිවාස වැඩසටහන භාරව කටයුතු කරන කළමනාකරු
iii. බැංකු සමිති කළමනාකරු
iv. දිස්ත්‍රික්කයේ සියළුම සමාජ සංවර්ධන සහකාරවරුන්

මේ සඳහා ප්‍රතිපාදන කොඩි අරමුදලේ 5% යොදා ගැනීම හෝ ප්‍රජාමූල අංශය මගින් ප්‍රගති සමාලෝචන වෙනුවෙන් එවන අරමුදල් ද යොදා ගනිමින් පැවැත්වීමට දිස්ත්‍රික් මට්ටමින් කටයුතු සූදානම් කර ගත යුතුය.

**b. ජාතික ප්‍රගති සමාලෝචනය**

මාස 06 කට වරක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට කැඳවා සමස්ථ වැඩසටහනේ ප්‍රගතිය හා ඉදිරි කටයුතු සාකච්ඡා කිරීම. (Presentation මගින්)
ඒ සඳහා පහත සඳහන් නිලධාරින් කැඳවීමට නියමිත වේ.

i. දිස්ත්‍රික් විෂයභාර කළමනාකරු
ii. සමාජ සංවර්ධන සහකාරවරුන්
iii. විශේෂ නිවාස වැඩසටහන භාරව කටයුතු කරන කළමනාකරු

ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය සෑම මසකම එළඹෙන මස 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගෙන සකස්කර ගත් දිස්ත්‍රික් වාර්තාව සෑම මසකම එළඹෙන මස 10 දිනට පෙර සමාජ සංවර්ධන අංශයට ලබාදිය යුතුය. (ඇමුණුම I)

ප්‍රජාමූල ප්‍රාදේශීය සංවිධාන හා වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ලබාගන්නා අරමුදල් (භාණ්ඩාගාර නොවන අරමුදල) යොදාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇති සමාජ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතියද ඉහත දිනටම ලබාදීමට කටයුතු කළ යුතුවේ. (ඇමුණුම II)

"ජාතික සමාජ සංවර්ධන අරමුදලින්"ද දිස්ත්‍රික්වලට ප්‍රතිපාදන ලබාදීමට බලාපොරොත්තු වන හෙයින් එම මුදල වියදම් කිරීමේදී එහි ප්‍රගතිය ලබාදීම ඒ සඳහා හඳුන්වාදී ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය. ( ඇමුණුම III)

සමාජ සංවර්ධන වැඩසටහනට අදාල ප්‍රගතිය කඩිනමින් ලබාදීමට socialdivision54@gmail.com ඊ-මේල් ලිපිනය භාවිතා කළයුතු අතර එය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් සනාථ කළ යුතු වේ.

සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශිය සංවිධාන, ප්‍රජාමූල සංවිධාන අරමුදල් යොදාගැනීමෙන් (කොඩි අරමුදල්) ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාකාරි සැලසුම් ප්‍රාදේශීය මට්ටමින් සකසා ගතයුතු වේ.

2026 වර්ෂයේ සමාජ සංවර්ධන අංශය සමාජීය, සංස්කෘතික සෞඛ්‍ය, මානසික හා පාරිසරික වශයෙන් ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් ඉහත පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. ඒ අනුව සමාජ සංවර්ධන සහකාර නිලධාරින් සවිබල ගැන්වීම් වැඩසටහනට අදාල පවුල් ලක්ෂ 02 මනෝ සාමාජීය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සවිබල ගැන්වීමට අදාල රාජකාරී ඉටුකළ යුතුවේ.

**ඉලක්ක**

1. සෑම සමාජ සංවර්ධන සහකාර නිලධාරියෙක්ම තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් සවිබල ගැන්වීම අදාල සියළු පවුල් මත්කාරක ද්‍රව්‍යවලින් මුදාගත යුතු වේ.
2. සෑම සමාජ සංවර්ධන සහකාර නිලධාරියෙක්ම තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලක්ක ගත පවුල් සංඛ්‍යාවම ආර්ථික, සමාජීය, සංස්කෘතික, සෞඛ්‍ය, මානසික හා පාරිසරික වශයෙන් සවිබල ගැන්විය යුතුවේ .

මේ සඳහා අවශ්‍ය කරන පවුල් තෝරා ගැනීම වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි සහභාගිත්වයෙන් සිදුකර, සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල නියෝජිතයින් සියළුම සංවර්ධන නිලධාරින් සියළු කලාප මූලස්ථාන හා සමිති කළමනාකරුවන් හා දිස්ත්‍රික් විෂයභාර නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් මෙම සමාජීය සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු අතර එහි වගකීම සමෘද්ධි සංවර්ධන නිලධාරි, සමාජ සංවර්ධන සහකාර, බැංකු සමිති කළමනාකරු හා විෂයභාර දිස්ත්‍රික් කළමනාකරු සතුවන අතර සම්පූර්ණ වැඩසටහන අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කටයුතු සිදු කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන් විසින් සිදු කළ යුතුවේ.

මීට අමතරව සමාජ සංවර්ධනය අංශයේ ප්‍රධාන වැඩසටහනක් වන නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල මගින් ක්‍රියාත්මක "සුවපහසු නිවසක්- සවිබලැති පවුලක් " තේමාව කොටගත් 2025 සමෘද්ධි නිවාස වැඩසටහන සඳහා මේ වනවිට ඔබ වෙත මූලික අත්තිකාරම් නිදහස් කර ඇති අතර ඉතිරි ප්‍රතිපාදන 2026 වසර තුල ලබාගෙන වැඩසටහන කඩිනමින් අවසන් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර සඳහා අංක 0112889046 හා 0112876601 මගින් සමාජ සංවර්ධන අංශය ඇමතීමෙන් ලබාගත හැකිය.

සී.ඩී. කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස /අ.ක.ස

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
04. සියළුම අධ්‍යක්ෂවරුන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
05. සභාපති, ජාතික සමාජ සංවර්ධන අරමුදල - දැ.ගැ.ස/අ.ක.ස
06. මහා සංගම් සභාපති - දැ.ගැ.ස/අ.ක.ස
07. බැංකු සමිති කළමනාකරුවන් - දැ.ගැ.ස/අ.ක.ස
08. සමාජ සංවර්ධන විෂයභාර දිස්ත්‍රික් කළමනාකරුවන් - දැ.ගැ.ස/අ.ක.ස
09. සමාජ සංවර්ධන සහකාර නිලධාරින් - දැ.ගැ.ස/අ.ක.ස